අප සමාජයේ 15% ක් පමණ කුමන හෝ ආබාධයක් සහිතව ජීවත් වේ යැයි ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. ඔවුන්ව සමාජය තුළ කිසිමාකාරයක කොන් කිරීමකට ලක් වීම වැළැක්වීම උදෙසා, ඔවුන්ට කිසිදු වෙනසක් නොවන ආකාරය භාෂාවක් යොදා ගැනීමේ වැදගත්කම පිළිබඳව Ethics Eye අපි නිරන්තරයෙන් පෙන්වා දී ඇත්තෙමු.

එහිදී පුද්ගල-ප්‍රථම භාෂාවක් (Person-first language) යෝග්‍ය නොවන්නේදැයි අප අසන්නේ ද ඒ අනුව වේ.

පසුගිය ජූලි 22, 2022 දින ගාලුමුවදොර සිදුවීමේදී ආබාධ සහිත වූවන්ට ආරක්ෂක අංශ පහරදුන් බවට වන චෝදනාව ප්‍රතික්ෂේප කරමින් "අයිතීන් උදෙසා අපි" සංවිධානය නිකුත් කළ ප්‍රකාශයට මාධ්‍ය ආවරණය ලබා දී ඇති ආකාරය, ඉහත කරුණ සම්බන්ධයෙන් අවධානයට ගැනීම වටී. එහිදී අරුණ හා දිනමිණ පුවත් වාර්තාවන් (ජූලි 28, 2022) පිළිබඳව අපගේ නිරීක්ෂණ මෙසේ යි.

"අයිතීන් උදෙසා අපි" මුල් මාධ්‍ය ප්‍රකාශය "ආබාධ සහිත තැනැත්තන්" යනුවෙන් යොදා ගනී.

දිනමිණ සිරස්තලය හා පුවත් අන්තර්ගතයද ඒ ආකාරයෙන්ම "ආබාධ සහිත තැනැත්තන්" යන්න යොදා ගනී.

අරුණ පුවත් සිරස්තලය "ආබාධිතයන්" යන්න යොදා ගනී.

ඔබ සිතන ලෙසට, "ආබාධිත" යන්නට වඩා "ආබාධ සහිත" යන්න පුද්ගල-ප්‍රථම භාෂාවකට වඩාත් අනුකූල නොවන්නේද?

පුද්ගල ප්‍රථම භාෂාවක් භාවිතා කරමු!

මූලාශ්‍ර:

http://www.disability.wa.gov.au/.../words_that_work_media...
https://ncdj.org/style-guide/
https://www.aucd.org/docs/add/sa_summits/Language%20Doc.pdf
https://www.who.int/.../fact.../detail/disability-and-health